# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

## 2020/2021 වර්ෂය සඳහා
## සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2020/2021 වර්ෂය සඳහා භාණ්ඩ, සේවා සැපයීම හා කොන්ත්‍රාත් ලබා ගැනීමට බලාපොරොත්තු වන, සුදුසුකම් ලත් සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**භාණ්ඩ සැපයීම**

1. මේස, පුටු, අල්මාරි, ලිපිගොනු කැබිනට් ආදී කාර්යාල උපකරණ (වානේ, දැව,ප්ලාස්ටික්)
2. කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර (මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, පරිලෝකන යන්ත්‍ර)
3. ලිපි ද්‍රව්‍ය (A4, අනු පිටපත් කොළ, පොත්, පෑන්, ෆයිල් කවර සහ අනෙකුත් කාර්යාල ලිපි ද්‍රව්‍ය)
4. වාහන ටයර්, ටියුබ් හා අමතර කොටස්
5. ආරක්ෂිත කැමරා පද්ධති
6. දුරකථන සහ අමතර කොටස්
7. විදුලි හා විදුලි උපකරණ අමතර කොටස්
8. වායු සමීකරණ යන්ත්‍ර හා අමතර කොටස්

**වැඩ හා සේවා සැපයීම**

1. ගොඩනැගිලි ඉදිකිරීම්, අළුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම්.
2. ජල කාන්දු වැලැක්වීම. (Water Proofing)
3. මුද්‍රණ සේවා (රබර් මුද්‍රා, නාම පුවරු, පොත්, අරාධනා පත්‍ර, ඇතුළු මුද්‍රණ කටයුතු)
4. කාර්යාල යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම (යතුරු ලියන, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර)
5. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම (වායු සමීකරණ යන්ත්‍ර, ආරක්ෂිත කැමරා පද්ධති,මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, පරිගනක යන්ත්‍ර)
6. පරිගණක ජාල ස්ථාපිත කිරීම සහ අලුත්වැඩියා කිරීම.
7. අභ්‍යන්තර විදුලි පද්ධති සකස් කිරීම හා වයරින් ඇදීම.
8. ගිනි නිවීමේ උපකරණ සපයා සවි කිරීම.
9. පවිත්‍රතා සේවාව /ගලි වලවල් හිස් කිරීම, ආහාර පාන සැපයීම.
10. වාහන නඩත්තු හා අළුත්වැඩියා කිරීම/පින්තාරු කිරීම.
11. සේවා ගිවිසුම් ( ස්වයංක්‍රීය දොර, විදුලි සෝපානය, විදුලි ජනකය වායු සමීකරණ යන්ත්‍ර)
12. ශබ්ද විකාශන පද්ධති අලුත්වැඩියාව
13. ගෙවතු අලංකරණය හා බිම් ගල් ඇල්ලීම.
14. ආපන ශාලා සේවා

සැපයුම්කරුවෙකුට එක් සේවාවක්, සැපයුමක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා ලියාපදිංචි විය හැකි අතර, ඒ අනුව ඕනෑම සේවා හෝ සැපයීම් එකක්, දෙකක් හෝ තුනක් සඳහා රු 600.00 ක මුදලක් ද අතිරේක එක් එක් සේවාවක් හෝ සැපයීමක් සඳහා රු 200.00 ක් බැගින් ආපසු නොගෙවන ගාස්තුවක් ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ 7041641 විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් නමට බැර වන සේ ගෙවීමට හෝ පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා වේලාවන් තුලදී මාලිගාවත්ත, කොළඹ 10, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සිව්වන මහලේ පිහිටි මුල්‍ය අංශයට ගෙවීම සිදු කල හැකිය.

මුද්‍රා තැබූ මිල ගණන් 2020/03/23 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ දෙපාර්තමේන්තුවේ සිව්වන මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකල හැකිය.

ලියාපදිංචි වීම සඳහා අයදුම්පත දෙපාර්තමේන්තුවේ මුල්‍ය අංශයෙන් හෝ http://pensions.gov.lk/index.php?lang=en වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

වැඩි විස්තර 0112472182 ඇමතීමෙන් ලබා ගත හැකිය.

සභාපති
දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටුව
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10

# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත 2020/2021

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**1 වන කොටස: සමාගමේ තොරතුරු** (අනිවාර්යය - අයදුම්කරු විසින් පිරවිය යුතුය)

| | | | | |
|---|---|---|---|---|
| සමාගමේ/කොන්ත්‍රාත්කරුගේ නම | | | | |
| ව්‍යාපාර ලියාපදිංචි/ඉක්ටැඩ් අංකය | | ලියාපදිංචි කළ දිනය | | |
| ව්‍යාපාර ආයතනයේ ලිපිනය | | | | |
| දුරකථන අංකය | | ජංගම දුරකථන අංකය | | |
| ඊමේල් (විද්‍යුත්) ලිපිනය | | | | |
| ෆැක්ස් අංකය | | වෙබ් අඩවිය | | |
| ව්‍යාපාර වර්ගය | සීමිත සමාගම් | | තනි ව්‍යාපාර | |
| | හවුල් ව්‍යාපාර | | වෙනත් | |
| ව්‍යාපාරයේ ස්වභාවය | නිෂ්පාදකයා | | සේවා | |
| | බලයලත් නියෝජිත | | වෙනත් | |
| මීට පෙර භාණ්ඩ, වැඩ හා සේවා සපයා ඇති රාජ්‍ය ආයතන | 1. | | | |
| | 2. | | | |
| | 3. | | | |
| | 4. | | | |
| | 5. | | | |
| ණය පහසුකම් සැපයිය හැකි කාල සීමාව. | | | | |
| ලියාපදිංචි ගාස්තු ගෙවන ලද රිසිට්පත් අංකය | | බැංකු ශාඛාව | | |

| ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන භාණ්ඩ,වැඩ හා සේවා සැපයීම | |
|---|---|
| 1. | 2. |
| 3. | 4. |
| 5. | 6. |
| 7. | 8. |
| 9. | 10. |
| (කරුණාකර සැපයීමට අදහස් කරන කාණ්ඩ සඳහා "√" සලකුණු කර භාණ්ඩ හා සේවා ලැයිස්තුව අමුණන්න) | |

**2 වන කොටස:වෙනත් තොරතුරු** (අනිවාර්යය - අයදුම්කරු විසින් පිරවිය යුතුය)

පහත තොරතුරු අමුණා තිබීම අනිවාර්යය වේ.

- සමාගම් පැතිකඩ (Company Profile)
- ව්‍යාපාර/ සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකය
- අධ්‍යක්ෂ මණ්ඩලය, හිමිකරුවන් හෝ හවුල්කරුවන්ගේ තොරතුරු හා ජාතික හැඳුනුම්පත් අංකය
- මූල්‍ය තත්ත්වය (පසුගිය වර්ෂයේ සහතික කළ මූල්‍ය ප්‍රකාශන)
- බලයලත් නියෝජිත ලෙස නිෂ්පාදකයා වෙනුවෙන් ගනුදෙනු කිරීමට බලය පවරා ඇති බවට සහතිකය
- ලියාපදිංචි වීමට අපේක්ෂා කරන නිෂ්පාදන/ සේවා සඳහා පසුගිය වසරේ ගනුදෙනු කළ ගනුදෙනුකරුවන්ගේ නම් සහ ලිපිනයන් ඇතුලත් ව්‍යාපාර ලැයිස්තුවක්. (කොන්ත්‍රාත්තු වල වටිනාකම් සමග)
- ලියාපදිංචි ගාස්තු ගෙවන ලද රිසිට්පත

1. ඒකකයක පිරිවැය පදනම් කරගෙන මිල ගණන් ඉදිරිපත් කිරීමට එකඟ වේද (ඔව් / නැත)
2. ඉල්ලීමක් කළහොත් භාණ්ඩ සාම්පල ලබා දීමට එකඟවේද (ඔව් / නැත)
3. අදාළ වන ඕනෑම තැනක වෙනම මිල ගණන් දෙකක් ඉදිරිපත් කිරීමට එකඟ වේද (ඔව් / නැත)
   1.තාක්ෂණික අංශය 2. මූල්‍ය අංශය
4. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ක්‍රියා පටිපාටීන් අනුගමනය කිරීමට ඔබ එකඟ වේද (ඔව් / නැත)

අවම වශයෙන් යොමු සමාගම් / පාරිභෝගික සම්බන්ධතා 2ක් දක්වන්න (Non Related Referees)

| | සමාගම /පාරිභෝගිකයා | නම හා තනතුර | දුරකථන අංකය |
|---|---|---|---|
| 1) | | | |
| 2) | | | |

මම / අප විසන් සපයනු ලබන ඉහත තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මම / අපි මෙයින් ප්‍රකාශ කරමි/ කරමු. ඉහත තොරතුරු වල යම් වෙනසක් සිදු වූ විටදීත්, එබඳු වෙනස්කම් සිදුකරන විටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමට මම / අපි තවදුරටත් එකඟ වෙමි/වෙමු.

| | | |
|---|---|---|
| ...................................... | ............................................. | ......................................... |
| නම සහ අත්සන | නම සහ අත්සන | සමාගම් රබර් මුද්‍රාව |

# කොන්දේසි

1. භාණ්ඩ හා සේවා පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතුය.

2. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක්, වැට් බදු සහතිකය සහ අතීත කාර්ය සාධනය සනාථ කරන වෙනත් ලේඛන සාක්ෂි අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. මෙහි ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන රජයේ දෙපාර්තමේන්තු, මණ්ඩල, සංස්ථා හෝ අර්ධ රාජ්‍ය ආයතන ඉහත ලිපි ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. නුසුදුසු අයදුම්කරුවන්ගේ ලියාපදිංචි ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

3. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය යටතේ සඳහන් කර ඇති පරිදි ව්‍යාපාරයේ ස්වභාවය අනුව සැපයිය හැකි භාණ්ඩ හෝ සේවාවන්ට පමණක් අදාළ අයදුම්පත ඇතුළත් කළ යුතුය.

4. තෝරාගත්, ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන නමුත් පවත්නා තත්වයන් යටතේ අනෙකුත් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා පිළිගැනීමේ අයිතියද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතුය.

5. අවශ්‍යතාවය පිළිබඳව නිසි පරිදි දැනුම් දුන් විට මිල ගණන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සැපයුම්කරුවන් හෝ ඇණවුම ලබා දුන් පසු නියමිත වේලාවට සැපයීමට සහ ලබා දීමට අපොහොසත් වන සැපයුම්කරුවන් සහ අදාළ පිරිවිතර හා නියැදියට අනුකූල නොවන සැපයුම් ඉදිරිපත් කරණු ලබන සැපයුම්කරුවන් අසාදු ලේඛණගත කරනු ලැබේ .

6. සැපයුම ලබා දීමට පෙර අදාල සැපයුම සඳහා ගෙවීම් අවශ්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි නොවිය යුතුය. අවම වශයෙන් දින 30 ක කාලයක් සඳහා ණය පහසුකම් ලබා දිය යුතුය.

7. සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමෙන් පසු වුවද මෙහි සඳහන් කොන්දේසිවලට එකඟ නොවන සැපයුම්කරුවන් වෙතොත් එවැනි සැපයුම්කරුගේ නම ලියාපදිංචි ලැයිස්තුවෙන් කපා හරිනු ඇත.

8. ලියුම් කවරයේ ඉහල වම් පස කෙලවර "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2020/2021" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් හෝ දෙපාර්තමේන්තුවේ සිව්වන මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.